# විශ්වවිද්‍යාල සිසුන් ක්‍රීඩා සඳහා යොමු වීම.
# (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

**ඩබ්. එන්. ඩී. එස්. එස්. වෙදමුණි**[1]

**සංක්ෂේපය**

විශ්වවිද්‍යාලය තුළ විද්‍යාර්ථයින් විෂය බාහිර ක්‍රියාකාරකම් ලෙස බොහෝ විට ක්‍රීඩා කටයුතුවල නිරත වීම බහුලව දක්නට ලැබේ. විද්‍යාර්ථීයා සිය පීඨයන් මත පදනම්ව ක්‍රීඩා වලට යොමුවන ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීම අරමුණු කරගනිමින් මෙම අධ්‍යයනය සිදු කෙරිණි. මෙහිදී කැලණිය විශ්වවිද්‍යාලය තුළ දැනට පවතින සමාජීය විද්‍යා පීඨය, මානව ශාස්ත්‍ර පීඨය, කළමනාකරණ හා වාණිජ පීඨය සහ විද්‍යා පීඨය යන පීඨ හතරම නියෝජනය වන පරිදි සසම්භාවී ව තොරාගත් විද්‍යාර්ථයින් 100 දෙනෙකු ඇසුරින් මෙම අධ්‍යනයට අවශ්‍ය ප්‍රාථමික දත්ත රැස් කර ගන්නා ලදී .ඒ සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය යන දත්ත රැස් කිරීමේ මාර්ග යොදා ගන්නා ලදී. එසේ රැස් කර ගන්නා ලද දත්ත සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රම අතර වන කේන්ද්‍රීය ප්‍රවණතා මිනුම් ආශ්‍රයෙන් විශ්ලේෂණය සිදු විය. මෙම අධ්‍යනය අවසානයේ අනාවරණය කරගත් කරුණු වූයේ මානව සහ සමාජීය විද්‍යා පීඨ වල සිසුන්ගෙන් 80% කිසිදු ක්‍රීඩාවක නිරත නොවේ. එමෙන්ම ක්‍රීඩාවට යොමුවන ඉතිරි 20% බොහෝ විට පාසල් මට්ටමේ ක්‍රීඩාවලට යොමු වීමෙන් ලද අත්දැකීම් හේතුවෙන් විශ්වවිද්‍යාලය තුළ ද ක්‍රීඩාවක නිරත වීමට හේතු වී ඇති අතර වැඩි දුර කරුණු විමර්ශනයේදී අනාවරණය විය. නමුත් විද්‍යා පීඨ සිසුන්ගෙන් 50% ආසන්න ප්‍රමාණයක් මෙන්ම වාණිජ සහ කළමනාකරණ පීඨයෙන් 35% ආසන්න ප්‍රමාණයක් ක්‍රීඩා සඳහා යොමු විමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. එහිදී අනාවරණය වූ තවත් වැදගත් කරුණක් වූයේ, විද්‍යා පීඨයේ සිසුන්ගෙන් බහුතරය හුදු විනෝදාස්වාදය සඳහා පමණක් ක්‍රීඩා කටයුතුවල නිරත වන බවයි. මේ අනුව පෙනී යන්නේ, සමස්තයක් වශයෙන් ගත් විට විශ්වවිද්‍යාලය තුළ ක්‍රීඩාව සඳහා විද්‍යාර්ථීයාගේ යොමු වීම පහළ මට්ටමක එනම් 25% වඩා අඩු මට්ටමක පවතින බවයි. විශ්වවිද්‍යාලය තුළින් ක්‍රීඩාව සඳහා සැපයන සම්පත්වලින් මීට වඩා ඵලදායී ලෙස උපයෝජනය කර ගැනීම සඳහා විද්‍යාර්ථීන් ක්‍රීඩාව සඳහා යොමු කරගත හැකි නව ප්‍රවේශ ගැන අවධානය යොමු කළ යුතුය.

**මුඛ්‍ය පද :** ක්‍රීඩා, විශ්වවිද්‍යාලය, විද්‍යාර්ථීයා

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, wedamunisammani@gmail.com